# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පවතින පරිවාස නිලධාරී(පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ) II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත හා සීමිත තරඟ විභාගය - 2016

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2016.06.25** වේ.

| තනතුරු නාමය | තනතුරු අංකය | පුරප්පාඩු විස්තර |
|---|---|---|
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියයේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2016 | *01* | *08* |
| උතුරු පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියයේ තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2016 | *02* | |

## 02 බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 අනුමත කරන ලද බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ.මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම හිමිකම් සහිත තනතුරු වේ.

02.2 මේවා ස්ථාන මාරුවට ලක්වන සේවාවන්ය. මෙම පත්වීම ලබන අය උතුරු පළාතේ කුමන හෝ ප්‍රදේශයක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.

## 03 සාමාන්‍ය සුදුසුකම්

03.1 අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

03.2 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. එනම් මෙම අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පූර්වාසන්නයෙන් වසර 06 ක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ 03 ක් වත් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටි අයෙකු විය යුතුය.

හෝ

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අඩුම වශයෙන් වර්ෂ 05 ක් වත් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටි අයෙකු විය යුතුය.
(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

03.3 අයදුම්කරු මනා ශරීර සෞඛ්‍යකින් හා හොඳ චරිතවත් පුද්ගලයෙක් විය යුතුය.

## 04 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයේ කුසලතාවය අනුව ද, බඳවා ගන්නා අවස්ථාවේ පවත්නා චක්‍රලේඛනද, බඳවා ගැනිමේ ව්‍යවස්ථාව, ජාතික හෝ පළාත් ප්‍රතිපත්ති අනුව ද බඳවාගනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේදි මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වේ නම් මෙම තනතුරට අදාළ හිමිකම් අවලංගු වේ.ලිඛිත පරීක්ෂණයපැවැත්වීම, ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.මේ අවස්ථාවේ දී අතිරේක ලකුණු ලබා දෙනු නොලැබේ. මෙම පත් විමට තෝරා ගැනිමේ දි ස්ථිර පදිංචි ස්ථානය සැලකිල්ලට ගනු ලැබේ.මෙය පසුව මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන ලද සහතික සැලකිල්ලට ගනු නොලැබේ.

04.1 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර, ඉල්ලුම් කරන ලද සුදුසුකම් ලබා දිය යුතු යි. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04.2 පුරප්පාඩු වලින් 3% ක් ආබාධිත පුද්ගලයන් සඳහා වෙන් කර ඇත. පත්වීම් සඳහා තෝරා ගැනිමේදි ආබාධිත පුද්ගලයන් රාජකාරි කිරීමට එම ආබාධිත තත්වය රාජකාරියට බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ විය යුතු ය.

04.3 පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියට බඳවා ගන්නා අවස්ථාවේදී පවතින පුප්පාඩු වලින් 30%ක් සීමිත තරඟ විභාගය මගින් පුරවනු ලැබේ.

04.4 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 01/2014 හා ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී නිකුත් කරනු ලබන චක්‍රලේඛ වලට අනුව සේවයට බැඳී අවුරුදු 05ක් ඇතුළතදී රාජ්‍ය භාෂාව සමත් විය යුතුය.

## 05 විභාග ගාස්තු

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රු.500/= ක් මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **3401** දරණ තැන්පත් ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කර නොමැත.

## 06 ඉල්ලුම් කරන ක්‍රමය

06.1 මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙ.මී.21 x සෙ.මී.29) කොළයක දෙපසම භාවිතයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2016.06.25** දින හෝ ඊට පෙර ලැබෙන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය,නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

06.2 මේ වන විට රජ්‍ය/පළාත් රජ්‍ය සේවය කරන නිලධාරින් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානින් මගින් තම අයදුම්පත ඉදිරිපත් කලහොත් පමණක් ඔහුගේ සේවය සැලකිල්ලට ගනු ලැබේ.

06.3 අයදුම්පත් යොමු කිරීමේදී අයදුම්පත් එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

06.4 එක් තනතුරකට වඩා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන සුදුසුකම් ඇති අපේක්ෂකයන් නියමිත පරිදි අයදුම්පත් සම්පූර්ණ කර එක් එක් තනතුරට වෙන් වෙන් වශයෙන් එවිය යුතුය. තවද ඉල්ලුම් කරන තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් ගෙවා රිසිට්පත් ලබා ගත යුතුය.

06.5 ඉල්ලුම්පතේ ජායා පිටපතක් තමා භාරයේ තබා ගැනිම ප්‍රයෝජනවත් වනු ඇත.ඉල්ලුම්පතේ ජායා පිටපත හෝ කලින් එවනු ලබන පිටපත භාර ගනු නොලැබේ. විභාගයට ආදාල වන ප්‍රවේශපත්‍ර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් එවනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර එවිම ඔබගේ සුදුසුකම් සනාථ කල බව සැලකිල්ලට නොගත යුතු ය.

06.6 මෙම විභාගය පවත්වන දිනය සම්බන්ධව පුවත්පත් මගින් දන්වනු ලැබේ.

06.7 මෙම විභාගයට පෙනී සිටීමට දින 03 කට ප්‍රථමයෙන් ප්‍රවේශ පත්‍ර නොලැබී තිබේනම් ඒ පිළිබඳ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය,නල්ලූර්, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය/ෆැක්ස් අංකය 021-221 9939)

## 07. අසත්‍ය බව තහවුරු වූ විට ලැබෙන දඬුවම්

අයදුම්පත්‍ර පිරවීමේ දි ඉතා සැලකිල්ලෙන් නිවැරදි තොරතුරු සැපයිය යුතු ය. අයදුම්කරු ඉදිරිපත් කල යම්කිසි තොරතුරක් අසත්‍ය බව තහවුරු වුවහොත් කුමන අවස්ථාවක හෝ අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කළහැක.

## 08. විභාග නගරය

විභාගයපැවැත්වීමට යෝජිත නගර සහ අංක පහත සඳහන් අයුරු වේ.

| **නගරය** | | **නගර අංකය** |
|---|---|---|
| යාපනය | - | 01 |
| වවුනියාව | - | 03 |

යම් නගරයක් සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම්,ළඟම ඇති විභාග නගරයට මාරු කරනු ලැබිය හැකිය.

## 09. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්

- විවෘත තරඟ විභාගය මගින් පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියයේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂයයන් වලින් එක් විෂයක් ප්‍රධාන විෂයක් ලෙස / එක් විෂයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධි සහතිකය (සමාජ විද්‍යාව Sociology/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/නීතිය/සමාජ වැඩ පිළිබඳ උපාධිය/මානව විද්‍යාව/ සමාජ විද්‍යා)

- සීමිත තරඟ විභාගය මගින් පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියයේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂයයන් වලින් එක් විෂයක් ප්‍රධාන විෂයක් ලෙස / එක් විෂයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් උපාධි සහතිකය (සමාජ විද්‍යාව Sociology/මනෝ විද්‍යාව/අපරාධ විද්‍යාව/නීතිය/සමාජ වැඩ පිළිබඳ උපාධිය/මානව විද්‍යාව/ සමාජ විද්‍යා)

ඒ සමඟ

අවුරුදු 5කට නොඅඩු සක්‍රීය සතුටුදායක ස්ථිර සේවයක් ඇති Hostel Keeper, Assistant Hostel Keeper, Trainee Demonstrator / Devolopment Officer / Management Assistant යන තනතුරු වල උතුරු පළාතේ පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තු සේවය කර තිබිය යුතුය.

- ඉහත සඳහන් තනතුරු වල සේවයේ යෙදී සිටින අය එම තනතුරු වල පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර තිබිය යුතුය.
- පසුගිය වසර 5ක් ඇතුළතදී කිසියම් විනයානුකුල දඬුවමකට ලක් නොවී තිබිය යුතුය.
- පසුගිය වසර 5ක කාලය තුළ වාර්ෂික වැටුප් වර්ධක සියල්ලම ලබා තිබිය යුතුය.

## 10. වැටුප් පරිමාණය

පවතින පරිවාස නිලධාරී(පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ) II වැනි ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි කේත අංක MN5-2016 අනුව මාසිකව රුපියල් 34,605 - 10 x 660 - 11 x 755 -15 x 930 - රු.63,460 වේ. (රු. 36,585ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

## 11.වයස සීමාව

අයඳුම්කරු අයඳුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 21ට නොඅඩු අවුරුදු 35ට නොවැඩි විය යුතුය. පරිවාස නිලධාරී සේවයේ II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා සීමිත තරඟ විභාගයට ඉල්ලුම් කරන අපේක්ෂකයන්ට ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.

## 12. ලිඛිත පරීක්ෂණය

මෙම විභාගය තරඟ විභාගයක් බැවින් පරිවාසනිලධාරී පත්වීමට සුදුසුකම් ඇති අපේක්ෂකයින් හට සමත් වීමට නම් ප්‍රශ්න පත්‍ර 02ට වෙන් වෙන්ව අඩුම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතු වේ.
පරීක්ෂණය දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පැවැත්වේ. මෙම ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

## 13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව

අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

## 14. විෂය නිර්දේශය

**I පරිවාස නිලධාරි සේවයේ II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය:-**

**බුද්ධි පරීක්ෂණය:- [පැය 01යි - ලකුණු 100යි]**

මෙම ප්‍රශ්න පත්‍රය මගින් අයදුම්කරුගේ ගණිතමය හැකියාව,තර්කානුකූල හැකියාව, විශ්ලේෂණය කිරීමේ හැකියාව, හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සාමාන්‍ය බුද්ධි යනාදිය පරීක්‍ෂා කරනු ලැබේ.

**භාෂා භාවිතය හා සාමාන්‍ය දැනීම:- [පැය 01යි - ලකුණු 100යි]**

- **භාෂා භාවිතය**
  මෙමගින් තීරණය ගැනීම, කරුණු ග්‍රහණය කර ගැනීමේ හැකියාව, වැරදි සොයා ගැනීම,ව්‍යාකරණ භාවිතය යන විෂයන් වල හැකියාව පරීක්ෂා කරනු ලැබේ.
- **සාමාන්‍ය දැනීම**
  මෙමගින් තනතුරට අදාළ කෂේත්‍රය සම්බන්ධව අයදුම්කරුගේ දැනීම පරීක්ෂා කිරීම කරනු ලැබේ.

**II පරිවාස නිලධාරි සේවයේ II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය**

**1. සිද්ධි අධ්‍යයනය (Case Study) වැඩ ම්බන්ධව කාත්ෂණික දැනීම [පැය 03යි - ලකුණු 100යි]**

1.1 දැනට පවතින ළමා අයිතිවාසිකම්, සම්ප්‍රදායන් හා ළමයින් සම්බන්ධ නීති රීති

1.2 ළමා වර්ධනය

1.2.1 ළමා වර්ධනය සම්බන්ධ හැඳින්වීම

1.2.2 වයස හා ළමයින්ගේ වර්ධනයේ පියවර

1.2.3 වර්ධන සංකූලතා

1.2.4 භාහිර පෙනුමේ වර්ධනය

**2. සමාජ වැඩ තාක්ෂණය හා ක්ෂේත්‍ර වැඩ තාක්ෂණය [පැය 03යි - ලකුණු 100යි]**

2.1 ක්ෂුද්‍ර, මධ්‍යම මට්ටම හා වැඩි මට්ටමක මැදිහත්වීම් (Interventions)

2.2 සමාජ කණ්ඩායම් වල ගුණත්වය

2.3 සමාජ කණ්ඩායම් වැඩ වල ක්‍රියාකාරී පියවර

2.4 සමාජ කණ්ඩායම් වැඩ වල මූලධර්ම හා වැදගත්කම

2.5 ශ්‍රී ලංකාවේ ඇති ජාති වර්ග

2.6 **සිද්ධි අධ්‍යයනය (Case Study)** සම්මේලනය, කළමනාකරණය,පවුල් කණ්ඩායම් වෙනුවෙන් ඇති සම්මේලනය, මැදිහත්වීම (Intervention) තාක්ෂණිකව නිමා කිරීමේ හැකියාව

මෙම දැන්වීමේ සඳහන් නොකළ හෝ අපහැදිලි කරුණු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අවසන් තීරණය ගනු ලැබේ.එ් සමඟම දෙමළ හා සිංහල භාෂා මාධ්‍ය දෙක අතර ඇති වන වෙනස්කම් පිළිබඳව සැලකිමේදි දෙමළ භාෂාව නිවැරදි වේ.

***ආර්.වරදලිංගම්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.